## සම්පූර්ණ කතාව

# සෙලාන්, අපට විශ්වාසයි



**අශෝක් පතිරගේ**
සභාපති - සොෆ්ට්ලොජික්
කළමනාකාර අධ්‍යක්ෂ - ආසිරි ආරෝග්‍යශාලා සමූහය

ප්‍ර. මෙම අර්බුදකාරී වාතාවරණය තුළ ඔබ සෙලාන් බැංකුව සමඟම රැඳී සිටියේ ඇයි?

පි. එයට හේතුව බැංකුව සහ ශ්‍රී ලංකාවේ බැංකුකරණ පද්ධතිය පිළිබඳ පූර්ණ විශ්වාසයක් අප සතුව පැවතීමයි. ශ්‍රී ලංකාවේ විශාලතම පුද්ගලික බැංකුවක් වන මෙවැනි දැවැන්ත ආයතනයක් බිඳ වැටීමට මහ බැංකුව ඉඩ නොතබන බවට අප තුළ විශ්වාසයක් පැවතුණා. අතීතයේ සිටම සෙලාන් බැංකුව නිරතුරුවම අපගේ අවශ්‍යතාවන් හඳුනාගනිමින් අපට සිදු කිරීමට අවශ්‍ය වූ සියලු දේ සාර්ථක කරගැනීම සඳහා සහායකයකු ලෙස ඉදිරිපත් වුණා. අපගේ මුළු සමාගම් සමූහය තුළම සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ් පහසුකම ක්‍රියාත්මක වෙනවා. මෙම අර්බුදය උද්ගතවීමත් සමඟ ඇතැම් ආයතන විසින් බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත භාරගැනීම ප්‍රතික්ෂේප කළ ද බැංකුව කෙරෙහි අප තුළ පැවති විශ්වාසය නිසා අපි නොකඩවාම එම ගනුදෙනු සිදු කළා.

ප්‍ර. සෙලාන් බැංකුවේ අනාගතය යහපත් වේ යැයි ඔබ විශ්වාස කරන්නේද?

පි. නිසැකවම. ශ්‍රී ලංකාව තුළ මනා අධීක්ෂණ හා පාලන ක්‍රම පවතින අතර, වර්තමානයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය කැපී පෙනෙනවා. තවදුරටත් බැංකුව පිළිබඳ විශ්වාසය වර්ධනය කරවීම සඳහා මහ බැංකුව විශ්වාසනීයත්වයෙන් යුත් නව හිමිකාරිත්වයක් පිළිබඳව සොයා බලනු ඇති. සෙලාන් බැංකුව සතුව ශ්‍රී ලංකාවේ පුද්ගලික බැංකු ක්ෂේත්‍රය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමේ මූලිකාංග සහ ව්‍යුහයන් පවතින බැවින් එය ජනසතු කිරීම සඳහා කටයුතු නොකරනු ඇති බවට මා බලාපොරොත්තු වෙනවා.

ප්‍ර. ඉදිරි මාස කිහිපය තුළ කුමක් සිදුවිය හැකිද?

පි. ලෝක ආර්ථික වාතාවරණය ගැන සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ සියලුම ක්ෂේත්‍රයන් වෙත එහි බලපෑම එල්ල වන නිසා සමස්ත ව්‍යාපාරික පරිසරය එතරම් පහසුවෙන් ඉදිරියට යාමක් දක්නට නොලැබෙනු ඇති. මේ සඳහා අප සූදානම් විය යුතු අතර, මනා වියදම් කළමනාකරණ ක්‍රමෝපායන් ප්‍රතිව්‍යුහගත කිරීම් ඔස්සේ එය සිදු කළ යුතු වෙනවා. ඉදිරි මාස 12 ඇතුළතදී ව්‍යාපාරික ක්ෂේත්‍රය යහපත් අතට හැරෙනු ඇති බවට මා තුළ විශ්වාසයක් පවතින අතර, ඒ වනතුරු ප්‍රවේශම් සහගතව පවතින තත්ත්වයට මුහුණ දීම සිදු කළ යුතු වෙනවා.



**ඉෂාර නානායක්කාර**
නියෝජ්‍ය සභාපති
LOLC ව්‍යාපාර සමූහය

ප්‍ර. අන් බොහෝ දෙනා සෙලාන් බැංකුවේ තැන්පතු ආපසු ලබාගනිද්දී ඔබ එසේ නොකළේ ඇයි?

පි. අපගේ ඇතැම් අනුබද්ධ ආයතනයන් ද ඇතුළුව LOLC ව්‍යාපාර සමූහය සඳහා මූලික බැංකුකරුවා වනුයේ සෙලාන් බැංකුවයි. සෙලාන් බැංකුවෙන් මෙම තැන්පතු ආපසු ගැනීමේ තත්ත්වය උදාවූයේ සෙලින්කෝ සමූහය විසින්, ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගමේ තැන්පතුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සෙලාන් බැංකුව සතු සිය කොටස් විකුණා දැමීමට සිදු වන බවට ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුවයි. අවාසනාවන්ත ලෙස මෙම පණිවිඩය වරදවා වටහා ගනු ලැබූ අතර, සෙලාන් තැන්පතුකරුවන් සිතන්නට වූයේ ගෝල්ඩන් කී සමාගමේ ණය ගෙවා දැමීම සඳහා සෙලාන් බැංකුව සතු වත්කම් විකුණා දැමීමට සැරසෙන බවයි. මෙම අර්බුදයේ මූලික තත්ත්වයන් තුළ බිය වීමට තරම් කරුණු අපට නොපෙනුන නිසා කලබලයට පත් තැන්පතුකරුවන් හා එක්වීමට අපට අවශ්‍ය වූයේ නැහැ.

ප්‍ර. සෙලාන් බැංකුව මෙම අර්බුදයෙන් මිදී යථා තත්ත්වයට පත් වනු ඇති බවට ඔබ විශ්වාස කරනවාද?

පි. ඔව්, සෙලාන් බැංකුව මෙම තත්ත්වයෙන් මිදෙනු ඇති බවට මාගේ විශ්වාසයයි. මහ බැංකුවේ කාලීන මැදිහත්වීම නිසා මෙම තත්ත්වය පාලනය කර ගත හැකි වුණා. බැංකුවේ කළමනාකාරිත්වය ලංකා බැංකුව වෙත පැවරීමත් සෙලින්කෝ සමූහයෙන් පරිබාහිර ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීමත් විශ්වාසය යළි ගොඩනැගීමේ යහපත් සංකේතයන් වෙනවා.

ප්‍ර. බැංකුව කෙරෙහි විශ්වාසය යළි ගොඩනැගී ඇති බවට ඔබ විශ්වාස කරන්නේ කවර හේතු මතද?

පි. ලංකා බැංකුවේ සහාය ඇතිව සෙලාන් බැංකුව ස්වාධීන ආයතනයක් වශයෙන් පාලනය කිරීමේ වගකීම නව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා තිබෙනවා. එම නිසා සෙලාන් බැංකුවේ පාරිභෝගිකයන් වෙත මාගේ පණිවිඩය වන්නේ "බිය නොවී බැංකුව සමඟ සුපුරුදු පරිදි ගනුදෙනු සිදුකරන්න" යන්නයි.



**ලක්ෂ්මන් නියන්ගොඩ**
නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ
ඩී. බවර් සහ සමාගම

ප්‍ර. ඇතැම් අය තැන්පත් කළ මුදල් ආපසු ගන්න පෙළඹෙද්දීත් ඔබ සෙලාන් බැංකුව සමඟ දිගටම ගනුදෙනු කරන්නේ ඇයි?

පි. ඇත්තටම කලබල වෙන්න දෙයක් සිදු වූයේ නැහැ. සෙලාන් බැංකුව සමඟ දිගු කාලයක් තිස්සේ අප අපගේ ගනුදෙනු කටයුතු කරනවා. මේ දක්වා කිසිදු ගැටළුවක් ඇති වූයේ නැහැ. ඔවුන්ගේ සේවය විශිෂ්ටයි. මහ බැංකුව නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කරමින් බැංකුවේ කටයුතු වඩාත් සුරක්ෂිත කරනු අප දුටුවා. එයින් වූයේ අපගේ විශ්වාසය තවත් තහවුරු වීම පමණයි. තැන්පත් කළ මුදල් ආපසු ගන්න හෝ කලබල වන්න හේතුවක් නැහැ.

ප්‍ර. සෙලාන් බැංකුවට අර්බුදයකට මුහුණ දීමට සිදුවෙතැයි කියා ඔබ සිතනවාද?

පි. කාර්යක්ෂම හොඳ කළමනාකරණයක් යටතට පැමිණි බැවින් ඔවුන් පෙරටත් වඩා හොඳින් කටයුතු කරනු ඇතැයි කියා මට විශ්වාසයි. මහ බැංකුවේ නීතිරීති අනුදැනුම යටතේ නව අධ්‍යක්ෂක මණ්ඩලය ක්‍රියාකරන බැවින් කිසිදු අර්බුදයක් ඇති වන්නේ නැහැ.

ප්‍ර. ඔබ දිගටම සෙලාන් බැංකුව සමඟ ගනුදෙනු කරනවාද?

පි. අපි සෙලාන් බැංකුව සමඟ කවදත් ගනුදෙනු කළේ සතුටෙන්. විශේෂයෙන් ඔවුන්ගේ සේවාවන් ඉතා ඉහළයි. එබැවින් ගනුදෙනු නොකිරීමට කිසිදු හේතුවක් මා දකින්නේ නැහැ.



**ඉරාජ් විජේසිංහ**
සභාපති
බාට්ලීට් ගෲප්

ප්‍ර. ඔබ සෙලාන් බැංකුව සමඟ ඉදිරියට කරගෙන යාමට බලාපොරොත්තු වන්නේ කුමක්ද?

පි. සෙලාන් බැංකුවත් ඊට සම්බන්ධ බොහෝ සමාගම් සමඟත් අපි බොහෝ කාලයක පටන් ගනුදෙනු කළා. අපි ඔවුන්ගේ සේවා මට්ටම් පිළිබඳව දැඩි සතුටට පත්ව සිටින නිසා මින් ඉදිරියටත් පෙර පරිදිම ගනුදෙනු කරනවා. එහි කිසිදු වෙනසක් වෙන්නෙ නැහැ.

ප්‍ර. වත්මන් තත්ත්වය අනුව සෙලාන් බැංකුව කෙසේ කටයුතු කරනු ඇත්දැයි ඔබ සිතනවාද?

පි. මහ බැංකුව නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කර සෙලාන් බැංකුවේ සෑම කටයුත්තක්ම මහ බැංකුවේ අනුදැනුම මත සිදු කරන්නට කටයුතු යොදා තිබෙනවා. නව අධ්‍යක්ෂක මණ්ඩලය හොඳින් එම කටයුතු සිදු කරනු ඇතැයි කියා මට විශ්වාසයි. එම කණ්ඩායම ඉතා හොඳ කණ්ඩායමක් බැවින් පවත්නා තත්ත්වය හොඳින් අවබෝධ කරගනිමින් සුදුසු ලෙස කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරනවා.



සංවාද සටහන
**සාවිත්‍රී රොද්‍රිගෝ**